*සැ. යු.*– 2007.09.28 දින පළ කරන ලද අංක 1,517 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,518- 2007 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා - 2007.10.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 910 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 911 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 912 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

*සැ. යු.*–විශේෂ භාණ්ඩ බදු පනත් කෙටුම්පත 2007, අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) 2007, අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත් කෙටුම්පත, 2007 අගෝස්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 413

DVF/RECT/143/(VI)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව

අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක් සහ ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

### නිලයේ ස්ථිර කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2004 නොවැම්බර් මස 26 වැනි දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත :

නි/2298 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) පෙට්ටගම් නන්දන ද සිල්වා, ශ්‍රීලංඉ.

### ස්වේච්ඡා උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2004 නොවැම්බර් මස 27 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත :

නි/2298 ලුතිනන් කර්නල් පෙට්ටගම් නන්දන ද සිල්වා, ශ්‍රීලංඉ.

අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

මේජර් ජනරාල් අසෝක කේ. ජයවර්ධන,
ආර්ඩබ්පී, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2005 මාර්තු මස 23 වැනි දින,
කොළඹ.

10-191

---

2007 අංක 414

D/RF/824/NY/01/07.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2007 ජනවාරි මස 21 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්* :

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) රොහාන් ජෝශප් එන්ආර්එක්ස් 0907, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ.

10-152

---

2007 අංක 415

D/RF/824/NY/01/07.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 පෙබරවාරි මස 23 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන්* :

ලුතිනන් (වියාබ) තිරන ගමගේ තුසිත දමින්ද, එන්ආර්ඉසෙඩ් 1225 ශ්‍රීලංනාහ.

*2007 පෙබරවාරි මස 28 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) සායක්කාරගේ මංජුල චන්දික, එන්ආර්එස් 1449, ශ්‍රීලංනාහ

*2007 මාර්තු මස 16 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) අබේගොඩ ලියන ආරච්චිගේ ජයසංක මියුරු විජයරත්න, එන්ආර්එස් 1208, ශ්‍රීලංනාහ.

*2007 මාර්තු මස 16 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්* :

ලුතිනන් ලියනාරච්චිගේ දොන් තනුජ ශාමේන්ද්‍ර, එන්ආර්එක්ස් 1209 ශ්‍රීලංනාහ

ලුතිනන් කොඩිප්පිලි පටබැඳිගේ ශාමේන්ද්‍ර ප්‍රදීප් කොඩිප්පිලි, එන්ආර්එක්ස් 1216, ශ්‍රීලංනාහ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ.

10-154

---

2007 අංක 416

D/RF/824/NY/01/07.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 පෙබරවාරි මස 28 දින සිට තාවකාලික ලුතිනන් කොමණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) කත්‍රිආරච්චි පින්නවල අප්පුහාමිලාගේ සේපාල සිරිතිලක, එන්ආර්එස් 1447, ශ්‍රීලංනාහ

ලුතිනන්(සැ) කරුණාරත්න විජේසුන්දර බණ්ඩාර මුදියන්සේලාගේ පියසේන විජේසුන්දර එන්ආර්එස් 1448, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) ජයසූරිය මුදියන්සේලාගේ නිලන්ත රුක්මන් ජයසූරිය එන්ආර්එස් 1450, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) රත්නායක මුදියන්සේලාගේ සමන් කුමුදු කුමාර රත්නායක එන්ආර්එස් 1451, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) රණසිංහ මොරපිටිය, එන්ආර්එස් 1452, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) තම්මිටගේ නලින් සංජීව පෙරේරා එන්ආර්එස් 1454, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) බලපුවඩුගේ නිශාඩි දේවප්‍රිය මෙන්ඩිස්, එන්ආර්එස් 1455, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) වෙල්ලන්ගිරිය ගෙදර පුංචි බණ්ඩා, එන්ආර්එස් 1456, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (සැ) විජේකෝන් වේබැද්ද රාලලාගේ ප්‍රභාත් භාග්‍ය විජේකෝන් එන්ආර්එස් 1457, ශ්‍රීලංනාහ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ.

10-153

---

2007 අංක 417

D/RF/824/NY/01/07.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 මාර්තු මස 17 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) වීරසුන්දර ජයසූරිය ආරච්චිගේ වනරාජ ප්‍රේමනාත් වීරසුන්දර, එන්ආර්පී 1033, ශ්‍රීලංනාහ

*2007 මාර්තු මස 23 දින සිට තාවකාලික ලුතිනන් කොමණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කුරුකුලසූරිය ප්‍රියා සංජේ ප්‍රනාන්දු එන්ආර්එක්ස් 1217 ශ්‍රීලංනාහ.

*2007 අප්‍රේල් මස 04 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) වීරකෝන් මුදියන්සේලාගේ චමින්ද බංදුල බණ්ඩාර එන්ආර්පී 1004, ශ්‍රීලංනාහ

*2007 අප්‍රේල් මස 06 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ලියනගේ සුසන්ත පෙරේරා ගුණවර්ධන, එන්ආර්ඊ 1214, ශ්‍රීලංනාහ.
ලුතිනන් (ඉ) හේරත් මුදියන්සේලාගේ දළුපතේගෙදර සංජය කුමාර බණ්ඩාර හේරත්, එන්ආර්ඊ 1218, ශ්‍රීලංනාහ.

*2007 අප්‍රේල් මස 06 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වී) වශයෙන් :*

ලුතිනන්(වී) වීරවර්ධන පතිරන්නැහැලාගේ චන්දන වීරවර්ධන, ශ්‍රීලංනාහ, එන්ආර්එල් 1220.

*2007 අප්‍රේල් මස 24 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) මාපුවානේ කංකානම්ගේ දිමුතු ප්‍රියංකර, එන්ආර්පී 1056, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුනි මස 13 වැනි දින,
කොළඹදීය.

10-155

---

# ආණ්ඩුවේ නිවේදන

## 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ කරනු ලබන නියෝගය

1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ 323 වගන්තිය යටතේ ගරු වරාය සහ ගුවන්සේවා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කොමරෝස් ධජය යටතේ ලියාපදිංචි අයි. එම්. ඕ. අංක 7906710 දරන එම්. වී. අල්මිසාන් නෞකාව එම පනතේ 114(1) වගන්තියේ විධිවිධානවලින්, එම නෞකාව කුළියට ගැනීම සඳහා සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය සහ එම නැවෙහි අයිතිකරුවන් අතර ගිවිසුමේ වලංගු කාලය අවසන් වනතුරු නිදහස් කරන ලද බව පොදුවේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

තිලක් කොල්ලුරේ,
ලේකම්,
වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

10-241

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.06.01 දිනැති අංක 11203 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වරකාගොඩ ආචාරිගේ චමින්ද වරකාගොඩ යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් නවලක්ෂ අනූ එක් දහස් හාරසිය විසි පහයි ශත විස්ස (රු. 9,91,425.20)ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.10.06 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් නවලක්ෂ අනූඑක් දහස් හාරසිය විසිපහයි ශත විස්ස (රු. 9,91,425.20) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් නව ලක්ෂ අනූඑක් දහස් හාරසිය විසි පහයි ශත විස්ස (රු. 9,91,425.20) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 11203 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, කලඔටුවාවෙහි පිහිටි මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඒ. යාපා විසින් 2005.09.21 වැනි දින මැන සකස් කළ අංක 1051 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : මාර්ගය ද, නැගෙනහිරට : ප්‍රධාන මාර්ගය ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : දෙවට පාර සහ ලොට් 2 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එක (අ. 0, රූ. 1, පර්. 0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 693/276හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-205

## මහජන බැංකුව - මොණරාගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකම තීරණය කල බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2005.03.02 වැනි දිනැති අංක 6331 දරන උකස්කරයේ ප්‍රකාර ගෙවීම් අංක 374, වැල්ලවාය පාර, මොණරාගල හි පදිංචි ධනපාල මුදියන්සේලාගේ ජයතිලක බණ්ඩාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 6331 දරන උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ අනූතුන්දහස් හත්සිය දා හතරයි ශත පනහක් (රු. 2,93,714.50) මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද එකී රුපියල් දෙලක්ෂ අනූතුන්දහස් හත්සිය දා හතරයි ශත පනහක් (රු. 2,93,714.50) සඳහා 2005.12.21 දින සිට සියයට විසිතුන (23%) බැගින් පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද වෙන්දේසි ගාස්තු ද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 6331 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ විස්තර

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළයේ, මොණරාගල ප්‍රාදේශීය සභා සීමාවේ කවුඩාව නමැති ගමේ පිහිටි "මැදගොඩ මූකලාන" සහ "අළුත්යාය" නමැති ඉඩමට 1982.02.15 දින හෝමාගම බලයලත් මානක එස්. ඒ. විජේසිංහගේ 218 දරන පිඹුරේ කැබලි අංක 9 යනුවෙන් සඳහන් උතුරට : වෙලන්ගස්යායනේන ද, නැගෙනහිරට : එෆ්. වී. පී. 480 සැලැස්මේ ලොට් 204 ලෙස වෙන් කර ඇති පාර ද, දකුණට : මැදගොඩ මූකලාන සහ අලුත්යාය ද (එෆ් වී. පී. 480හි කැබලි අංක 239 ද) සහ ඉහත අංක 218 පිඹුරේ කැබලි අංක 10 කොටසක් ද, බස්නාහිරට : ඉහත අංක 218 පිඹුරේ කැබලි අංක 10 සහ 8 යන සීමාව තුළ පිහිටි අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් එකී ඉඩම් කැබැල්ලට යාමට සහ ඊමට වූ සියළුම මාර්ගවල මාර්ග අයිතිය ද වේ.

මෙය මොණරාගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල් 37/248 දරන පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 719, වැල්ලවාය පාර,
මොණරාගල.

10-208

## මහජන බැංකුව - ගාල්ල මහවීදිය (169)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2005.11.14 දිනැති අංක 227 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මාසකෝරාලගේ ජයවර්ධන සහ මාසකෝරාලගේ සිරිවර්ධන යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් ලක්ෂ පහලව (රු. 15,00,000)ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.11.28 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් ලක්ෂ පහලව (රු. 15,00,000) ක මුදක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් ලක්ෂ පහලව (රු. 15,00,000)ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 227 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාව තුළ කලහේ පිහිටි උඩහගෙදර වත්ත *නොහොත්* පහලබදුවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ඩී. ෆොන්සේකා විසින් 1983 ජනවාරි මස 08 සහ 16 දිනයන්හි මැන සාදන ලද අංක 2447 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබැලි අංක ඒ සඳහා මායිම්, උතුර-නැගෙනහිරට : මහවත්ත *නොහොත්* පහලබදුවත්ත ද, දකුණු-නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණු-බස්නාහිරට : බී දරන කැබැල්ල සහ උතුරු-බස්නාහිරට : අලුත්වත්ත ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් තිස්තුනයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 33.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 695/141 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.

10-207

## මහජන බැංකුව - ගාල්ල මහවීදිය - 169

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2006.04.07 දිනැති අංක 589 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. ආරෝෂිනී විසින් සහතික කරන ලද 2006.08.25 දිනැති අංක 1452 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, ගාල්ල ඕල්කට් මාවත, අංක 97 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අංක එන්(පීවීඑස්) 20617 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි ස්ථාපිත සමාගමක් වන JIC (පුද්ගලික) සමාගම බන්ධනදායී සමාගම වශයෙන් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් පනස් ලක්ෂය (රු. 50,00,000) ක සහ රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) ක මුදල් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.04.07 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් පන් ලක්ෂය (රු. 50,00,000) ක සහ 2006.12.30 වැනි දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් ලක්ෂය (රු. 50,00,000) සහ රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) ක මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 589 සහ 1452 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ මහ නගර සභාවේ දන්ගෙදර ඕල්කට් මාවත පිහිටි වරිපනම් අංක 97 උළුගෙදරවත්ත *නොහොත්* කුඩා උළුගෙදර වත්ත *නොහොත්* බෙලිගස් වත්ත නැමැති ඉඩමේ කේ අක්ෂරය දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එච්. එල්. ආර්. ජයසුන්දර විසින් 1999.03.01 දින මැන සහතික කරන ලද අංක 774 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කේ1 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පාර, මෙම ඉඩමේම ඉතිරි කොටස සහ සාන්චිනෝනගෙවත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස, පාර සහ මෙම ඉඩමේම කේ2 දරන කැබැල්ල ද, දකුණට : මෙම ඉඩමේම අදිරියන් නොතාරිස් සහ ඉන්පසු ජයනේරිස් අප්පුහාමි දැනට ඒ. ආර්. එම්. මවුජුඩ් සහ සහෝදරයන් හිමිකම් කියන ඉඩම *නොහොත්* වඩුවන්ගහවත්ත සහ මෙම ඉඩමේම ලොට් කේ2 දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේම අඩි 6ක් පළල පාර සඳහා වෙන්කල කොටස ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිහයි දශම හයයි (අ. 0, රූ. 2, පර්. 30.6) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි, ගහකොළ ආදී සියලු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 559/280 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත අංක 774 දරන පිඹුරේ නිරූපිත මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

10-209

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නාල ද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද අංක 12909 හා 2005 නොවැම්බර් මස 03 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "එක්ලැට්" යන නාමය, අභිධානය යන ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස මීගමුවේ ව්‍යාපාරය කරගෙන යන මීගමුවේ අබ්දුල් වහාබ් මොහමඩ් අස්මි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ජූනි මස 30 වැනි දිනට ඉහත කී අංක 12909 දරන උකස් බැඳුම්කරය මත එකී අබ්දුල් වහාබ් මොහොමඩ් අස්මි යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පනස්හත් ලක්ෂ විසිඑක් දහස් තුන්සිය පනස් එකක (රු. 57,21,351) මුදලක් සහ 2007 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් දෙලක්ෂ හතලිස් පන් දහස් හයසිය හතරක් (රු. 52,45,604) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකම වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාකියක් වන, ආසන්නතම ඉහළ 0.5% ලෙස තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පනස්හත් ලක්ෂ විසිඑක් දහස් තුන්සිය පනස් එකක (රු. 57,21,351) මුදල සහ 2007 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් දෙලක්ෂ හතලිස් පන් දහස් හයසිය හතරක් (රු. 52,45,604) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකම වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5% ලෙස තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී අංක 12909 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 12909 දරන උකස් බැඳුම්කරය මගින් ඩිඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ, ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 12909 හා 2005.11.03 වැනි දින දරන උකස් බැඳුම්කර මගින් උකස් කර න ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත අංක 10 ග්‍රෑන්ඩ් ස්ට්‍රීට් නාගරික කොට්ඨාශය තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එල්. සී. දාබරේරා විසින් මැන සාදන ලද අංක 7838/2000 හා 2000.08.23 දින දරන පිඹුරේ දැක්වෙන සූරියගහවත්ත සහ කම්පුවත්ත නමැති බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට : මීගමුව මුස්ලිම් පල්ලියේ දේපළ සහ මහ වීදිය (මේන් ස්ට්‍රීට්) ද, නැගෙනහිරට : එම්. එම්. මොහමඩ් නිසාම්ට සහ තවත් අයෙකුට අයිති දේපළ ද, දකුණට : මේරි වෙරෝනිකා ප්‍රනාන්දුගේ දේපළ ද, බස්නාහිරට : ලොට් අංක 03හි කොටසක් (ග්‍රෑන්ඩ් ස්ට්‍රීට් වරිපනම් අංක 11 දරන පරිශ්‍රය) මීගමුව මුස්ලිම් පල්ලියට අයිති දේපළ පැසේජය සහ ලොට් අංක 01හි කොටසක් (මහවීදිය වරිපනම් අංක 218 දරන පරිශ්‍රය) ද, එහෙත් ලොට් අංක 03හි කොටසක් සහ මීගමුව මුස්ලිම් පල්ලියේ දේපළ ලෙසට වැරදියට ප්‍රකාර කර ඇති යන මායිම් ඇතුළත පර්චස් හයකුත් දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 6.4) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි, ගහකොළ සහ ඊට අනුබද්ධ සියලු දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරි.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-147/3

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය, ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නාල ද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද අංක 3422 හා 2006 අප්‍රේල් 18 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "නවීන් තේ" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන මැටියගනේ පදිංචි විජේසිංහ ආරච්චිලාගේ ජයතිලක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ජූනි මස 30 වැනි දිනට ඉහත කී අංක 3422 දරන උකස් බැඳුම්කරය මත විජේසිංහ ආරච්චිලාගේ ජයතිලක යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හාරලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය හැත්තෑනවයකුත් ශත තිස්තුනක (රු. 4,79,379.33) මුදලක් සහ 2007 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ

විසිපත් දහස් පන්සිය විසිහතක (රු. 4,25,527) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකම වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතියක් වන, ආසන්නතම ඉහළ 0.5% ලෙස තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හාරලක්ෂ හැත්තෑනව දහස් තුන්සිය හැත්තෑනවයකුත් ශත තිස්තුනක (රු. 4,79,379.33) මුදල සහ 2007 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ විසිපත් දහස් පන්සිය විසිහතක (රු. 4,25,527) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකම වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යම මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5% ලෙස තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී අංක 3422 දරන උකස් බැඳුම්කරව ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3422 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ, ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 3422 හා 2006.04.18 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, බටහිර උඩුකහ කෝරළේ, මැටියගනේ පිහිටි "මොරගොල්ලාහේන සහ හාල්පන්කොටුවේකුඹුරේ වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඒ. එස්. ගුණසිරි විසින් මැන සාදන ලද අංක 782 හා 1999.08.07 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඊ. එම්. ධර්මතිලකට අයිති වත්ත (බලයලත් මිනින්දෝරු ආර්. ජී. ඒ. රත්නායක විසින් මැන සාදන ලද අංක 1543 දරන පිඹුරේ ලොට් අංක 2) ද, නැගෙනහිරට : මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන පාර, දකුණට : නිවාසයක සිට එන පාරද; බස්නාහිරට: ටී, බී. සේතුංගගේ වත්ත (ආර්. ඒ. ජී. රත්නායක විසින් මැන සාදන ලද අංක 1543 දරන පිඹුරේ ලොට් අංක 2) ද යන මායිම් ඇතුළත පර්චස් දහයකුත් දශම දෙකයි බින්දුවක් (අ. 0, රු. 0, පර්. 10.20) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-147/4

---

### සෙලාන් බැංකුව පීඑල්සී-කොළඹ දකුණ ශාඛාව
### 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0680-පී17477-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ජූලි මස 09 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ආර්. පුෂ්පා කුමාරි විසින් සහතික කරන ලද 2005 ජූලි මස 18 දිනැති අංක 505 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වැල්ලවත්තෙහි ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 34314 දරන ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් වන රෝමා ප්‍රොපටි ඩෙවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හතලිස් දෙලක්ෂ හත්දහස් අටසිය එකයි ශත හතලිස් අටක (රු. 2,42,07,801.48) මුදලක්, 2006 දෙසැම්බර් මස 29 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,42,07,801.48 මුදල ද, 2006 දෙසැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇතත්ම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 505 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභාව තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, වැල්ලවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු පී. ආර් නානායක්කාර විසින් සාදන ලද අංක 1963 ජනවාරි මස 31 දිනැති අංක 14 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කලින් කැනැල් බෑන්ක් නමින් හඳුන්වන ලද වේළුවනාරාමය පාර වරිපනම් අංක 183 දරන මාදංගහවත්ත නමැති ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ කැබලි අංක 8 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : කැබැලි අංක 12බී, 21බී සහ සී ද, නැගෙනහිරට : පීජීජී 3527හි කැබලි අංක 22, වෙළුවනාරාමය පාර ද, දකුණට : කැබලි අංක 9 සහ බස්නාහිරට : කැබැලි අංක 7 ද යන මායිම් තුළ එකී අංක 14 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම අටයි අටක් (අ. 0, රු. 0, පර්. 16.88) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම්

ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් වැල්ල 169/106 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-179

---

## සෙලාන් බැංකුව පීඑල්සී-අනුරාධපුර ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0210-02359570-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. කේ. කේ. වීරකෝන් විසින් සහතික කරන ලද 2000 ජනවාරි මස 03 දිනැති අංක 134 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අනුරාධපුර පදිංචි ත්‍යාගරාජා ටෝනි බෙන්ජමින් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ තිස්දෙදහස් නවසිය හතලිස් නවයයි ශත පහක (රු. 4,32,949.05) මුදලක්, 2006 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,32,949.05 මුදල ද, 2006 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 134 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

1. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, කනදරා කෝරළේ, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 14ඒ (නුවරවැව) අනුරාධපුර නගර සභා සීමාව තුළ අනුරාධපුර නව නගරයේ අදියර 1හි පිහිටි අනුරාධපුර නගර සභාවේ වැඩ අධිකාරී විසින් සකසන ලද 1979 නොවැම්බර් මස 22 දිනැති අංක යූ. සී. 1 දරන සැලැස්මේ සඳහන් ඇලබොඩ කැලේ නමැති අංක 86 දරන යූ. සී. කුලී නිවාසය සමග ඉඩමේ අංක 86 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක 85 ද, නැගෙනහිරට : ලොට් අංක 109 ද, දකුණට : ලොට් අංක 87 සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් හයයි දශම අටයි තුනක් (අ. 0, රූ. 0, පර්. 6.83) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව ඒ 307/289 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-178/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී-කෝපරේට් බැන්කිං ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදි කර ඇත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0864-ඩී95451-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 18 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාගි සිවදාසන් විසින් සහතික කරන ලද 1999 මාර්තු මස 22 දිනැති අංක 48 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 04හි ලියාපදිංචි එන්(පීවීඑස්) 18430 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ෆෝ ස්ටාර් නිට්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූපන්ලක්ෂ පනස්හතරදහස් හාරසිය අසූ දෙකයි ශත දහනවයක් (රු. 95,54,482.19) මුදලක්, 2007 පෙබරවාරි මස 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 95,54,482.19 මුදල ද, 2007 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 48 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහපත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (පින්නගොල්පල්ල ග්‍රා. නි. කොට්ඨාශය) නාම්බාදළුව පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 1995.11.24 දිනැති අංක 1074 දරන සැලැස්මේ සඳහන් ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන (මිනුම්පති විසින් සාදන ලද පීපීගම් 2542 හි පෙන්නුම් කරනු ලබන කැබලි අංක 4 හි කොටසක් සේ වැඩිදුරටත් විස්තර කරනු ලබන) බලයලත් මිනින්දෝරු පී, බී. අබේනායක විසින් සාදන ලද 1996.12.11 දිනැති අංක 2293ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මල්වත්ත නමැති ඉඩමේ කැබලි අංක ඒ2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ1 කැබැල්ල ද, නැගෙනහිරට : පත්තලගෙදර සිට ප්‍රධාන පාරට යන පාර ද, දකුණට : ජාතික තරුණ සේවා සභාව සඳහා වෙන් කල ඉඩම සහ අත්තනගල්ල අධිකරණය පීපීගම් 2542 හි කැබැලි අංක 5 සහ බස්නාහිරට : පීපීගම් 2542හි සඳහන් ඒ කැබැල්ලෙහි ඉතිරි කොටස, බීඕඅයි පාර සඳහා වෙන් කල ඉඩම සහ අත්තනගල්ල අධිකරණය (පීපීගම් 2542 හි කැබලි අංක 5) යන මායිම් තුළ අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) *නොහොත්* හෙක්ටයාර් බිංදුවයි දශම අටයි බිංදුවයි නවයයි දෙකක් (0.8092) ක් විශාල ඉඩම. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එෆ් 198/202 හි ලියාපදිංචි කර ඇත.

එකී ඒ2 කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 1995 නොවැම්බර් මස 27 දිනැති අංක 1074 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි බෙදා වෙන් කරන ලද කොටසක් වන අතර ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව එෆ් 198/201හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 1074 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී ඒ කැබැල්ල මිනුම්පති විසින් වලංගු කරන ලද 1995 මැයි මස 23 දිනැති අංක පීපීගම් 2541හි පෙන්නුම් කරනු ලබන කැබලි අංක 4 හි බෙදා වෙන් කරන ලද කොටසක් වන අතර ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව 169/126 හි ලියාපදිංචි කර ඇත.

අධක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-178/3

---

## සෙලාන් බැංකුව පීඑල්සී-රත්නපුර ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0070-01799080-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණයඅයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 2005 නොවැම්බර් මස 03 දිනැති අංක 3906 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම පරකඩුව පදිංචි ජයසිංහ මුදියන්සේලාගේ කමලා රණසිංහ සහ නන්දිකා ධර්මප්‍රිය අබේවර්ධන යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දහසය දහස් තුන්සිය හැටඑකයි ශත අනූහතක (රු. 2,16,361.97) මුදලක්, 2007 පෙබරවාරි මස 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,16,361.97 මුදල ද, 2007 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3906 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, උඩපත්තු උතුර ඉහළ පොහොරඩාව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්නන් විසින් සාදන ලද 2005.02.24 දිනැති අංක 6638බී1 දරන සැලැස්මේ සඳහන් කළුබෝගොඩ උඩහගෙදරවත්ත නමැති ඉඩමෙන් කැබලි අංක 1 ලෙස නිරූපනය කරනු ලබන වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : හැඩිල්ලේ වෙල කුඹුර ද, නැගෙනහිරට : දන්තහාමිගේ වත්ත ද, දකුණට : කැබලි අංක 1හි ඉතිරි කොටස සහ පාර සහ බස්නාහිරට : ඇල්ල ලියද්ද කුඹුර ද යන මායිම් තුළ අක්කර එකයි පර්චස් දහනවයක් (අ. 1, රූ. 0, පර්. 19) විශාල ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව ඒ 659/256 යටතේ ලියාපදිංචි කර ඇත.

අධක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-178/4

---

## සෙලාන් බැංකුව පීඑල්සී-ගල්කිස්ස ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0030-654656-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින්

ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2005 මැයි මස 13 දිනැති අංක 3614 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්මලාන ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 27735 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ට්‍රොපිකල් රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූදෙලක්ෂ හතලිස් හයදාහයි ශත හතක (රු. 92,46,000.07) මුදලක්, 2007 මාර්තු මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 92,46,000.07 මුදල ද, 2007 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3614 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපලෙහි ඇති බදු අයිතීන් බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

පහත සඳහන් ඉඩමේ අවසන් නොවූ බදු අයිතීන් :

